HUMAN RIGHTS WATCH

## ශ්‍රී ලංකාව : රජය විසින් සිදු කරන මානව හිමිකම් උල්ලංඝනය කිරීම් ඉහළ යයි.

***අපරාධ වලට වගකිව යුතු පුද්ගලයන්ට දඬුවම් දීම සිදු නොවී පවතිද්දී ඝාතන, පැහැර ගැනීම් සහ අවතැන් වීම් ඉහළ යයි.***

(නිව්යෝර්ක්, 2007 අගෝස්තු 6,) දෙමල ඊලාම් විමුක්ති කොටි (එල්.ටී.ටී.ඊ.) සමග ප්‍රධාන අවි ගැටුම් යලි ආරම්භවීමේ පටන් ඇති වූ නීති විරෝධි ඝාතන, අතුරුදහන් කිරීම් සහ වෙනත් බරපතල මානව හිමිකම් උල්ලංඝනය කිරීම්වලට ශ්‍රී ලංකා රජය වගකිව යුතු යැයි අද පුවත්පත් නිවේදනයක් නිකුත් කළ "හියුමන් රයිට්ස් වොච්" සංවිධානය පවසයි.

ගෙවී ගිය මාස 18ක කාලය තුල රජයේ සන්නද්ධ සේවාවන් මගින් සිදු කළ මානව හිමිකම් උල්ලංඝනය කිරීම් ප්‍රමාණය වේගයෙන් ඉහළ යාම පිළිබඳව අවධානය යොමු කළ හියුමන් රයිට්ස් වොච් සංවිධානය ශ්‍රී ලංකාව තුලට එක්සත් ජාතීන්ගේ නිරීක්ෂණ කණ්ඩායමක් එවීමට සහාය දක්වන ලෙස ශ්‍රී ලංකාවට ආධාර දෙන කණ්ඩායම්වලින් සහ මේ පිළිබඳව උනන්දුවක් දක්වන රටවලින් ඉල්ලා සිටියේය.

දෙමල බෙදුම්වාදී කණ්ඩායමක් වන එල්.ටී.ටී.ඊ.ය, ඉලක්කගත සිවිල් පුද්ගලයන් මරාදැමීම, කප්පම් ගැනීම සහ ළමා සොල්දාදුවන් යොදා ගැනීම බඳු බරපතල අපරාධවලට වගකිව යුතු අතර, හියුමන් රයිට්ස් වොච් සංවිධානය ඒවා යලි යලිත් සටහන් කොට ඒවා පිළිබඳ තම අප්‍රසාදය පල කොට තිබේ.

රජයේ සන්නද්ධ සේවාවන් විසින් සිදුකරන උල්ලංඝනයවීම් භයානක ලෙස ඉහළ යාම දැක්වෙන එමගින් විපතට පත්වූවන්ගේ සහ ඇසින් දුටු සාක්ෂිකරුවන්ගේ විස්තර, "යුද්ධයට ආපසු යාම : මානව හිමිකම් වැටලීම" නැමති පිටු 129 නව වාර්තාවේ දැක්වේ. මෙම උල්ලංඝනය කිරීම්වල ප්‍රධාන ප්‍රහාරය එල්ල වී ඇත්තේ දෙමල ජනතාව බව පවසන වාර්තාව එසේ නමුත් මුස්ලිම් සාමාජිකයන් සහ බහුතර සිංහල ජනගහනයද රජයේ මානව හිමිකම් උල්ලංඝනය කිරීම්වලින් බේරී නොමැති බව දක්වා තිබේ. පෙනී යන අන්දමට ශ්‍රී ලංකා ආණ්ඩුව "ජරා යුද" උපක්‍රම භාවිතා කිරීම සඳහා ආරක්ෂක හමුදාවලට කොළ එළියක් නිකුත් කර ඇතැයි හියුමන් රයිට්ස් වොච් සංවිධානයේ ආසියා අධ්‍යක්ෂ බ්‍රැඩ් ඇඩම්ස් පැවසීය. "ඔහුට අනුව එල්.ටී.ටී.ඊ.ය විසින් මානව හිමිකම් උල්ලංඝනය කිරීම, ශ්‍රී ලංකා රජයට ඝාතන ව්‍යාපාර, අතුරුදහන්වීම් සහ අවතැන්වූවන් බලහත්කාරයෙන් ආපසු යැවීම සඳහා සාධාරණ හේතුවක් නොවේ".

රජය සහ එල්.ටී.ටී.ඊ.ය අතර 2002 දී අත්සන් කළ සටන් විරාම ගිවිසුම තාක්ෂණිකව පවතින නමුත්, 2006 මැද භාගයේදී එදිරිවාදිකම් යලි හට ගත්තේය. සිවිල් ජනගහනයේ ආරක්ෂාව පිළිබඳව සැලකිල්ලක් දැක්වීමකින් තොරව ජනාධිපති මහින්ද රාජපක්ෂ සහ ඔහුගේ සොහොයුරු ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ රටේ උතුරු සහ නැගෙනහිර යුද මෙහෙයුම් ආරම්භ කළ බව හියුමන් රයිට්ස් වොච් සංවිධානය පැවසීය.

ආරක්ෂක හමුදා විසින් සිවිල් වැසියන්ට කිසිදු වග විභාගයකින් තොරව පහරදුන් අතර මානුෂීය ආධාර බෙදා දීම්වලටද බාධා පැමිණවීය. 2006 අගෝස්තුවල සිට ඇතිවූ අවි ගැටුම් හේතුවෙන් 315,000 ක් වන පිරිසකට සිය නිවාස අත්හැර පළායාමට සිදුවූ අතර ඉන් සාතිශය බහුතරය දෙමල සහ මුස්ලිම් ජාතිකයෝය. මාර්තු මාසයේදී පමණක් 100,000 ක් පමණ අවතැන් වූහ. රජයේ ආරක්ෂිත හමුදා බලහත්කාරයෙන් ඉන් කොටසක් තවමත් අනාරක්ෂිතව පවතින එම ප්‍රදේශවලට ආපසු යැව්ය.

ගෙවී ගිය වසර එකහමාරක කාලය තුලදී පැහැර ගැනීම් සහ අතුරුදහන් වීම් නරක අන්දමට වැඩි වී ඇති බව හියුමන් රයිට්ස් වොච් සංවිධානයට වාර්තා විය. 2006 ජනවාරි සහ 2007 ජූනි අතරදී අළුතින් එබඳු සිදුවීම් 11,000 ක් වාර්තා වූ අතර ඒ අතරින් අති බහුතරය දෙමල පුද්ගලයන්ය. පැහැරගැනීම් පිලිබඳව එල්.ටී.ටී.ඊ. ය දිගු කලක සිටම වගකිව යුතු අතර, මෑතකදී සිදුවූ “අතුරුදහන් වීම්” බහුතරයක් මගින් පෙන්නුම් කෙරෙන්නේ රජයේ හමුදා හෝ සන්නද්ධ කණ්ඩායම් රජයේ ආශිර්වාදය යටතේ ක්‍රියාත්මක වන බවය.

හමුදාවේ දැඩි පාලනය යටතේ පවතින උතුරේ පිහිටි යාපනය අර්ධද්වීපය තුල පමණක් 2005 දෙසැම්බර් සිට 2007 අප්‍රේල් අතරදී පුද්ගලයින් 800 කට අධික පිරිසක් අතුරුදහන් වූ බව වාර්තා වූ අතර ඔවුන් අතරින් 241ක් පසුව සොයා ගැනිනි. ඇසින් දුටු සාක්ෂිකරුවන් සහ පවුලේ සාමාජිකයන් චෝදනා කරන ආකාරයට එබඳු බොහෝ සිදුවීම්වලට රජයේ ආරක්ෂක අංශ ඍජුව දායක වී හෝ සම්බන්ධ වී තිබේ.

2006 අගෝස්තු මාසයේදී රජය විසින් හදිසි නීති රෙගුලාසි යලි හඳුන්වා දුන් අතර එමගින් ශ්‍රී ලංකා සහ අන්තර්ජාතික නීති යටතේ ආරක්ෂා කර තිබූ සාමකාමී කටයුතු ගණනාවක්ම අපරාධ ලෙස නම් කරනු ලැබීය. රජය මෙම නීතිය දේශපාලන විරුද්ධවාදීන්ට සහ ජනමාධ්‍ය සාමාජිකයන්ට එරෙහිව ක්‍රියා කිරීමට භාවිතා කොට තිබුණි.

2005 අගෝස්තු මාසයේ සිට මාධ්‍යවෙදින් 11ක් ඝාතනය වූ ශ්‍රී ලංකාවේ ජනමාධ්‍ය නිදහස නරක අතට හැරී ඇති බවද වාර්තාව සඳහන් කරයි. විශේෂයෙන්ම දෙමල මාධ්‍යවේදීන් එල්.ටී.ටී.ඊ. ය සහ දෙපාර්ශවයේම බලවත් තර්ජන යටතේ වැඩ කරන අතර, වැදගත් ප්‍රවෘත්ති සහ අදහස් දක්වන සිංහල භාෂා ප්‍රකාශනවලට බලපෑම් කිරීමටද රජය කටයුතු කර තිබේ.

අවි ගැටුම හෝ රජයේ මානව හිමිකම් වාර්තා පිලිබඳ ප්‍රවේශය ගැන විපරම් කරන හෝ විවේචනය කරන පුද්ගලයින් නිහඬ කිරීමට රජය ක්‍රියා කර තිබේ. රජය එහි සාමකාමී විවේචකයින්, "ද්‍රෝහීන්", ත්‍රස්තවාදයට උදව් දෙන්නන් සහ " එල්.ටී.ටී.ඊ. හිතවාදීන්" ලෙස හංවඩු ගසා ඇත.

"ශ්‍රී ලංකාව තුල විරුද්ධ මත මැඩලීම සඳහා එල්.ටී.ටී.ඊ. ය සමග පවතින ගැටුම සහ ත්‍රස්තවාද- විරෝධී ප්‍රවාදය රජය විසින් යොදා ගනී" යැයි ඇඩම්ස් කිය. "ගැටුම් පැවති වකවානුවල පවා භාෂණයේ නිදහස රැකීම පිලිබඳ දිගු ඉතිහාසයක් සහිත රටක මේය සිදුවීම් ඉතාම අනතුරුදායක ප්‍රවණතාවකි."

2004දී එල්.ටී.ටී.ඊ. යෙන් වෙන්ව ගිය, එල්.ටී.ටී.ඊ.යට එරෙහිව ශ්‍රී ලංකා හමුදා සමග සහයෝගයෙන් කටයුතු කරන දෙමල සන්නද්ධ කණ්ඩායමක් වන කරුණා කණ්ඩායම විසින් ශ්‍රී ලංකා රජයේ සහයෝගය හෝ එකඟත්වය සහිතව ළමුන් සහ තරුණයන් පැහැර ගෙන ගොස් බඳවා ගැනීම තවමත් සිදු කරයි. 2006 දෙසැම්බර් මස සිට කරුණා කණ්ඩායම විසින් ළමුන් බඳවා ගැනීම සහ යළි බඳවා ගැනීමේ අවස්ථා 145ක් ගැන යුනිසෙෆ් සංවිධානය වාර්තා කරන නමුත් සත්‍ය සංඛ්‍යාව එයට බොහෝ ඉහළය.

කරුණා කණ්ඩායම විසින් කප්පම් ලබා ගැනීම සඳහා මඩකලපුවේ, වවුනියාවේ සහ අගනුවර වන කොළඹදී දෙමල ව්‍යාපාරිකයින් ගණනාවක්ද පැහැරගෙන තිබේ. කරුණා කණ්ඩායමේ පැහැර ගැනීම්වලට රජයේ අංශ වල සම්බන්ධයක් ඇත්දැයි සෙවීමට පරීක්ෂණ පවත්වන බවට යලි යලිත් පොරොන්දු වූ නමුත්, රජය එබඳු පරීක්ෂණ සඳහා කිසිදු පියවරක් ගත් බවට සලකුණක් නොමැති අතර, පැහැර ගැනීම් අඩුවක් නොවී සිදු වේ.

ශ්‍රී ලංකා රජයේ අනුමැතිය සහිතව හෝ හිතාමතා හෝ කරුණා කණ්ඩායම සිදු කරන පැහැර ගැනීම්වල රටාව 2007 ජනවාරි මාසයේ නිකුත් කළ වාර්තාවක හියුමන් රයිට්ස් වොච් සංවිධානය වාර්තා කොට ඇත.

රජයේ ආරක්ෂක අංශ විසින් මානව හිමිකම් උල්ලංඝනය කරන විට ඊට දඬුවම් නොපැනවීම ශ්‍රී ලංකාවේ ගැටළුවක්ව පවතින අතර එය අනතුරුදායක ලක්ෂණයකි. ගැටුම උග්‍ර වන අතර සහ මානව හිමිකම් උල්ලංඝනය කිරීමේ දිගු ලැයිස්තු මගින් රජයේ ආරක්ෂක අංශ දෙසට ඇඟිල්ල දිගු වන නමුත් බරපතල උල්ලංඝණය කිරීම්වලට වගකිව යුතු පුද්ගලයින්ට එරෙහිව ක්‍රියා කිරීමට ඇති අකමැත්ත රජය පැහැදිලිව ප්‍රදර්ශනය කර තිබේ.

රජය සහ එල්.ටී.ටී.ඊ. ය විසින් සිදුකරන ලද මානව හිමිකම් උල්ලංඝනය කිරීම් අතරින් නිශ්චිත සිදුවීම් පරීක්ෂා කිරීමට පත් කරන ලද ජනාධිපති කොමිසමක් රට තුල මානව හිමිකම්

තත්ත්වය නරක අතට හැරීම පාලනය කිරීමෙහි ලා ප්‍රමාණවත් නොවන බව එම වාර්තාව පවසයි. කොමිසම විසින් උත්සාහ දරමින් තිබෙන්නේ, දේශිය සහ ජාත්‍යන්තර විවේචන වැලැක්වීමට විනා වගවය යුතු බව ප්‍රවර්ධනය කිරීමට හෝ අනාගත උල්ලංඝනය කිරීම් හින කිරීමට නොවේ.

“උල්ලංඝනය කිරීම් අවසන් කිරීමටත් ඒවා ගැන පරීක්ෂණ කිරීමටත් රජය යලි යලිත් පොරොන්දු වී ඇති නමුත්, ඒ සඳහා පලදායක පියවරක් ගැනීමට අවශ්‍ය දේශපාලන අධිෂ්ඨානය රජය තුල ඇති බවත් පෙන්වා නැත.” යි ඇඩම්ස් කියා. “උල්ලංඝනය කිරීම්වල පරිමාණය හෝ තිව්‍රතාවය අරඹයා කටයුතු කිරීමට රජයේ ආයතන අසමත් බව හෝ අකමැති බව ඔප්පු කොට තිබේ.”

එදිරිවාදිකම් පවතිද්දී සිවිල් වැසියන් ආරක්‍ෂා කිරීම ඇතුළු අන්තර් ජාතික නීතිය සඳහා ගරු කිරීමට රජය සහ එල්.ටි.ටි.ඊ.ය යන පාර්ශව දෙක පෙළඹවීම සඳහා සිය ශක්තිය යොදවන ලෙස හියුමන් රයිට්ස් වොච් සංවිධානය ශ්‍රී ලංකාවට ආධාර සපයන අන්තර් ජාතික ප්‍රජාවෙන් ඉල්ලා සිටියි. අන්තර් ජාතික ආධාර උපයෝගී කර ගනිමින් මෙම බලපෑම සිදු කල හැකි අතර, එක්සත් රාජධානිය, ජර්මනිය බඳු රාජයයන්, විසින් මෑතකදී එකඟ වී ඇති ආකාරයට රජය සිය භාවිතාව වර්ධනය කර ගන්නා තුරු ආධාර ලබා දීම් සීමා කිරීමට තිරණය කර තිබේ.

රජය සහ එල්.ටි.ටි.ඊ. ය යන දෙපාර්ශවයෙහිම භාවිතාවේ වෙනසක් ඇති කිරීමට පෙළඹවීම සඳහා, එක්සත් ජාතින්ගේ මානව හිමිකම් කවුන්සිලය තුලදී මේ පිළිබඳව උනන්දුවක් දක්වන රටවල් විසින් ඊට සහයෝගය දක්වන ශක්තිමත් යෝජනා සම්මත කර ගත යුතු යැයි වාර්තාව පවසයි.

වැදගත්ම දෙය වන්නේ රජය, එල්.ටි.ටි.ඊ. ය සහ කරුණා කණ්ඩායම විසින් සිදු කරන මානව හිමිකම් උල්ලංඝනය කිරීම් පිළිබඳ නිරීක්‍ෂණය කිරීමට, පරීක්‍ෂා සිදු කිරීමට සහ වාර්තා කිරීමට බලය සහිත එක්සත් ජාතින්ගේ මානව හිමිකම් නිරීක්‍ෂණ මණ්ඩලයක් ශ්‍රී ලංකාවේ පිහිටුවීම සඳහා අදාල රටවල් සහ ශ්‍රී ලංකා රජය විසින් කටයුතු කල යුතුය.

“සිවිල් වැසියන් ආරක්‍ෂා කිරීමට, අනීතික භාවය අවසන් කිරීමට සහ ගැටුම සම්බන්ධයෙන් මානව හිමිකම්වලට ගරු කරන ආකාරයේ විසඳුමක් ලබා දීමට ආධාර දීම සඳහා එක්සත් ජාතින්ගේ මානව හිමිකම් නිරීක්‍ෂණ මණ්ඩලයක් තිබීම ප්‍රයෝජනවත් වනු ඇතැයි.” ඇඩම්ස් පැවසීය.